

# සලාතයේ ඵල ප්‍රයෝජන

සලාතය ෂහාදවට පසුව වන ප්‍රධානතම යුතුකම වන්නේ ය. සලාතය ඉටු කරන ලෙස අල් කුර්ආනය විවිධ ස්ථානවල අපට අණ කරයි. එය විධිමත්ව සහ අල්ලාහ් වෙනුවෙන් ම යන "ඉඛ්ලාස්" නමැති හැඟීමකින් යුක්තව ඉටු කරන මෙන් ඉස්ලාම් අපට නියෝග කරයි. මෙසේ සලාතය නිසි අයුරින් ඉටු කරන විට අපට මෙලොවෙහි හා පරලොවෙහි අපරිමිත වූ ඵල ප්‍රයෝජන හා යහපත් දෑ අනිවාර්යයෙන් ම ලබාගැනීමට හැකි වේ. මෙම ප්‍රයෝජන සමහරක් ගැන දැන් සලකා බලමු.

## සලාතයෙන් ලැබෙන පරලොව ප්‍රයෝජන

### 1. සලාතය පාප ක්‍රියාවලින් අප මුදා ගනී.

අප ඉටු කරන සලාතයන් අපගේ සුළු පව් ඉවත් කර අප පාරිශුද්ධ කරයි. සලාතය සඳහා තබන සෑම පියවරක් වෙනුවෙන් ම අපගේ පව් සමා කෙරේ.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසූහ. "පස් වේල් සලාතය ඉටු කිරීම ඔබගේ නිවස ඉදිරියේ ගලන දිය පහරකින් දිනපතා පස් වේල් නෑම හා සමාන ය" (සහීහ් මුස්ලිම්)

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා තවත් වරක මෙසේ කීවේ ය.
"පස්වේල් සලාත එක් ජුම්ආවකින් තවත් ජුම්ආවකට, එක් රමළානයකින් තවත් රමළානයකට ආදිවශයෙන් ඒවා අතර සිදුවන පව්වලට පව් සමාව වන්නේ ය." (සහීහ් මුස්ලිම්)

## 2. සලාතය ආලෝකයක් ලබා දේ.

අඛණ්ඩව සලාතය ඉටු කරන විට ඔහු මෙලොවෙහි සහ පරලොවෙහි ප්‍රභාවයක් ලබති. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ වදාළහ.

"කවරෙක් සලාතය විධිමත් ලෙස ඉටු කරයි ද එය ඔහුට ආලෝකයක් වශයෙන් ද සාක්ෂියක් වශයෙන් ද මතුදිවියේ දී විමුක්තිය ද වන්නේ ය. කවරෙක් එය නිසි ලෙස ඉටු නොකළේ ද ඔහුට එහි ආලෝකයක් හෝ විමුක්තියක් නොලැබේ. ඔහු කියාමාවේ දී හාරූන්, ෆිර්අව්න්, හාමාන්, උබයි ඉබ්නු හලෆ් ආදීන් සමඟ සිටී." (අහ්මද්)

## 3. සලාතය ඉටුකරන පුද්ගලයාට ඉහළ තත්ත්වයක් ගෙන දෙන්නේ ය.

සලාතය ඉටු කරන්නා අල්ලාහ්ගෙන් ඉහළ තත්ත්වයක් ලබා ගන්නේ ය. මතු දිවියේ දී ඉතාමත් ශ්‍රේෂ්ඨ අයකු වශයෙන් ඔහු සිටී. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා තම මිතුරන්ට මෙසේ කීවේ ය. "ඔබ වැඩියෙන් සුජූද් කරන්න. සැබැවින් ඔබ සුජූද් කරන විට ඔබව එක් පියවරකින් උසස් කරවන්නේ ය. පවක් සමා කරන්නේ ය." (මුස්ලිම්)

## 4. සලාතය ස්වර්ගයේ යතුරයි.

අප ස්වර්ගයට යෑම සඳහා සලාතය විධිමත්ව ඉටුකිරීම අනිවාර්ය වේ. සලාතය නිසි පරිදි ඉටු නොකරන්නා කිසිවිටෙකත් මෙම භාග්‍යය ලබන්නේ නැත. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් වෙත රබීආ බින් කඃබ් රළියල්ලාහු අන්හු "දූතයාණනි! ස්වර්ගයේ දී මම ඔබ සමග සිටීම ප්‍රිය කරමි" යි, කීවේ ය. එයට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ "වෙනත් යමක් අවශ්‍ය ද?" යි විමසූහ. "නැත. අවශ්‍ය එය පමණි" යැයි කීවේ ය. "එසේ නම් ඔබ වැඩි වැඩියෙන් සුජූද් කිරීමට හුරු කර ගන්න." යැයි කීවේ ය. (මුස්ලිම්)

තවත් වරක් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ වදාළහ.
"සලාතය ස්වර්ගයේ යතුර වේ" (තිර්මිදි)

"කවරකු උදේ සහ දහවල් කාලයේ (සලාතය වෙනුවෙන්) මස්ජිදයට යන එන තැනැත්තකු ලෙස සිටී ද ඒ සෑම අවස්ථාවක ම අල්ලාහ් ඔහුට ස්වර්ගයේ උසස් ස්ථානයක් සූදනම් කර තබන්නේ ය." (බුහාරි හා මුස්ලිම්)

## 5. සලාතය ඉටුකරන්නන් වෙනුවෙන් මලාඉකාවරු ප්‍රාර්ථනා කරති.

සලාතය ඉටුකරන්නන් වෙනුවෙන් මලක්වරු සෑම දිනකම ප්‍රාර්ථනා කරති. දීර්ඝ හදීසයක අවසානයේ මෙසේ දැක්වේ.

"අයෙක් මස්ජිදයට ගොස් සලාතයේ යෙදෙමින් සිටියේ නම් මලක්වරු ඔහුට සලවාත් කියති. (එනම් ප්‍රාර්ථනා කරති) ඔවුහු මෙසේ පවසති. "යා අල්ලාහ්! මොහු වෙත දයාව දක්වනු මැනවි! යා අල්ලාහ්! මොහුගේ පව්වලට සමාව දෙනු මැනවි!" (බුහාරි මුස්ලිම්)

6. සලාතය අසීමිත කුසලයන් ලබා දෙන්නේ ය.

සලාතය විධිමත්ව හා ඉඛ්ලාසයෙන් යුතුව ඉටු කරන විට අසීමිත ආනිසංස අල්ලාහ් අපට ලබා දෙන්නේ ය. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ වරක් මෙසේ කීහ.

"කවරෙක් තම නිවසේ දී වුලූඃ කර තමන්ට අනිවාර්ය සලාතය ඉටුකිරීම සඳහා පිටත් ව යන්නේ ද, ඔහුට ඉහ්රාම් පැලඳු හාජිවරයකුගේ ආනිසංස ලැබෙන්නේ ය." (අබීදාවූද්)

## සලාතයෙන් ලැබෙන ලෞකික ප්‍රයෝජන

1.සලාතය නරක හා පාප ක්‍රියාවලින් අප වළක්වයි.

සලාතය විනයානුකූල මිනිසුන් බිහි කරයි. අඛණ්ඩ ලෙස සලාතය ඉටු කරන්නා ම්ලේච්ඡ ක්‍රියා කිරීමට ලැජ්ජා වන්නේ ය. "නිරතුරුව ම අල්ලාහ් තමා දෙස බලා සිටී" යන හැඟීම දනෙයි. පාප ක්‍රියා මගින් තමා ඉටු කරන සලාතයේ ඵල ප්‍රයෝජන අහිමි කර ගැනීමට ඔහු කැමති නොවෙයි. අල් කුර්ආනය මෙසේ දක්වන්නේ එය යි. **"ඇත්තෙන් ම සලාතය ලැජ්ජාකාරී සහ වළක්වන ලද ක්‍රියා වළක්වයි" (29: 45)**




2. සලාතය යහපත් සෞඛ්‍යයක් ලබා දෙයි.

සලාතය හොඳ ව්‍යායාමයකි. සිරුරේ බොහෝ අවයව සලාත් කරන අවස්ථාවේ දී චලනය වෙයි. කෙනෙක් කාර්යක්ෂම ලෙස තම කටයුතු ඉටු කිරීමට සලාතයෙන් පුහුණුවක් ලබයි. සලාතය නොකඩවා ඉටු කරන කෙනෙකු සැමවිට ම පිරිසිදුව සිටියි. සලාතයේ දී නැම හා වුලූඃ කිරීම මගින් සිරුර පිරිසිදුව තබා ගැනීමට අපි පුහුණුව ලබන්නෙමු. එය ශාරීරික හා මානසික නිරෝගීතාවට වැදගත් වේ.

### 3. සලාතයෙන් අපට මානසික නිදහස හා සැනසුම හිමි වේ.

සලාතය චිත්ත පීඩනය, දොම්නස, අසහනය වැනි ඒවායින් අප මුදවා ගනියි. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ ගැටලු ඇති වන අවස්ථාවල දී "ඕ බිලාල් එම සලාතය මගින් අපට සැනසුම ලබා දෙන්න" යැයි පවසති. තව ද " මගේ ඇසේ සිසිලස තිබෙන්නේ සලාතයේ ය" යැයි පවසති. (අහ්මද් හා නසඊ)

### 4. සලාතය එකමුතුකම ඇති කරයි.

ජමඅත් වශයෙන් සලාතය ඉටුකරන මෙන් ඉස්ලාමය නිතර අවධාරණය කර ඇත. මෙමගින් කිසියම් ගමක හෝ ප්‍රදේශයක වාසය කරන සියලු දෙනා ම දිනකට පස්වේලක් එක ම ස්ථානයකට රැස් වෙති. වර්ණ, භාෂා, ප්‍රාදේශීය වෙනසකම් අමතක කර එක පෙළක සිටිමින් එකමුතුව සලාතය ඉටු කරති. නායකත්වයටත්, අවනත වීමටත් ජමාඅත් සලාතය මගින් ඉගෙන ගනිති. සලාතයෙන් පසුව හමු වී සැප දුක් විමසා ගනිති.
මෙමගින් සමාජයේ සාමය  සහ සහයෝගය වර්ධනය වන්නේ ය.



### 5. සලාතය මගින් කාල කළමනාකරණය සඳහා පුහුණුව ලබා දේ.

බොහෝ සලාතයන් ඉටු කළ යුතු කාලච්ඡේද වෙන්කර දක්වා ඇත. මේවා නියමිත වේලාවට ඉටු කිරීමෙන් වේලාවට වැඩකිරීමේ පුහුණුව අපි ලබන්නෙමු. සලාතය මෙන් ම අනෙකුත් කරුණු ද සැලසුම් කර නියම වේලාවට ඉටු කිරීමට සලාතය අපට පුහුණුව ලබා දේ. එමෙන් ම උදැසන නැගිට යුහුසුළුව ක්‍රියාත්මක වීමට ද තහජ්ජුද්, ෆජ්ර් සලාතය උපකාරී වේ.

**මෙවැනි  විවිධ ඵල ප්‍රයෝජන සලාතය මගින් අපට ලැබෙන්නේ ය. එනිසා මෙලොව දී සහ පරලොව දී විමුක්තිය ලැබීමට සලාතය විධිමත්ව ඉටු කරමු.**

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

إِخْلَاصٌ شَهَادَةٌ

**අභ්‍යාස**

1. සලාතය විධිමත් ව ඉටුකිරීමෙන් මෙලොවෙහි ලබන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

2. සලාතය ඉටුකිරීම නිසා පරලොවේ දී ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

3. සමූහ වශයෙන් සලාතය ඉටුකිරීම නිසා ලැබෙන විශේෂ ප්‍රයෝජන මොනවා ද?

4. ස්වර්ගයට පිවිසීමට සලාතය කෙසේ හේතු වන්නේ දැයි පැහැදිලි කරන්න.

5. සලාතයේ ප්‍රයෝජන පිළිබඳව එක් හදීසයක් සොයා අරාබි භාෂාවෙන් ලියන්න.